මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

මෘදු කුසලතා සංවර්ධන ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# 'විදුදය විවාදය 2016'

## විවාද මාතෘකා

### පළමු වටය

I. ලිංගික අධ්‍යාපනය මගින් අපරාධ පාලනය කළ හැකිය. නොහැකිය.

II. පරිභෝජනවාදී ආර්ථික රටාවක් නිර්මාණය වීම කෙරෙහි ප්‍රචාරණ මාධ්‍යය තීරණාත්මක සාධකයක් වී ඇත. නැත.

III. පවත්නා ගෝලීය ආර්ථික විෂමතා අවම කිරීමෙහිලා ජාත්‍යන්තර සංවිධානවල දායකත්වය සාධාරණීකරණය කළ හැක. නොහැක.

IV. දුම්කොළ හා මධ්‍යසාර සඳහා අධික බද්දක් පැනවීම මගින් ඒවා පරිභෝජනය අධෛර්ය කරයි. නොකරයි.

V. ශ්‍රී ලංකාව සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ දී මෙරට පවත්නා බහු සංස්කෘතික වටපිටාව වඩාත් සාධනීය කාර්යය භාරයක් ඉටු කරයි. නොකරයි.

VI. ධරණීය සංවර්ධන ප්‍රමුඛතා මුදුන් පත් කර ගැනීමෙහි ලා නූතන තාක්ෂණයේ මිශ්‍ර පරිභෝජනය අභියෝගයක් වේ. නොවේ.

### දෙවන වටය

I. ගෝලීය බලශක්ති අර්බුදය විසඳීමෙහි ලා න්‍යෂ්ටික බලාගාර ඉදිකිරීම සුදුසු වේ. නොවේ.

II. රාජ්‍යයන්හි ස්වාධීනත්වය සම්බන්ධ තීරණවලට ජාත්‍යන්තරයේ මැදිහත්වීම සාධාරණීකරණය කළ හැක. නොහැක.

### තුන්වන වටය

I. රැකියා ක්ෂේත්‍රයේ ඉල්ලුම පිරිමැසීමට කටයුතු කිරීම විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි වගකීම වේ. නොවේ.

### අවසාන වටය

I. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංවර්ධනයට පවත්නා සමාජයේ දායකත්වය සාධාරණීකරණය කළ හැක. නොහැක.

## II. අන්තර් අධ්‍යයනාංශ විවාද තරගාවලියේ පෙළගැස්ම

**දිනය - පළමු වටය** : 2016. 11. 17 : ආර්. ආර්. පෙරේරා ශාලාව, ව්‍යවහාරික විද්‍යාපීඨ ශ්‍රවණාගාරය : පෙ.ව. 8 සිට ප.ව. 5 දක්වා

**දෙවන වටය** : 2016. 11. 24 : ආර්. ආර්. පෙරේරා ශාලාව :ව්‍යවහාරික විද්‍යාපීඨ ශ්‍රවණාගාරය :පෙ.ව. 12 සිට ප.ව. 5 දක්වා

**තුන්වන වටය** : 2016. 11. 28 : ව්‍යවහාරික විද්‍යාපීඨ ශ්‍රවණාගාරය : පෙ.ව. 9 සිට ප.ව. 2 දක්වා

**අවසාන වටය** : 2016. 11. 30 : ව්‍යවහාරික විද්‍යාපීඨ ශ්‍රවණාගාරය : පෙ.ව. 9 සිට ප.ව. 2 දක්වා

### තරග නීති රීති හා කොන්දේසි

I. අන්තර් අධ්‍යයනාංශ විවාද තරගාවලිය සඳහා මාතෘකා තෝරා ගැනීම 2016. 10. 19 වන දින පීඨ රැස්වීම් ශාලාවේ දී දහවල් 12ට සිදු කරනු ලැබේ. තරගාවලිය සඳහා සහභාගී වීමට බලාපොරොත්තු වන සියලු ම කණ්ඩායම් අධ්‍යයනාංශය නියෝජනය කරනු ලබන ගුරුවරයා ද සමග මේ සඳහා පැමිණිය යුතුය. කණ්ඩායම් නායකයා විසින් මෙදින මාතෘකාවට අදාළ අංකය හා යෝජක ප්‍රතියෝජක ද යන බව තෝරාගනු ලැබේ.

II. තරගය සඳහා තරගකරුවන් 05 හා අතිරේක 01 අයෙකුගේ නම් ඇතුළත් කළ යුතුය. නමුත් තරගය සඳහා ඉදිරිපත් විය හැකි වනුයේ තරගකරුවන් 05 දෙනෙකුට පමණි.

III. තරගය සඳහා සහභාගි වන තරගකරුවන් එම අධ්‍යයනාංශයේ ම සිසුන් වීම අනිවාර්ය වේ. විශ්වවිද්‍යාලය හැර ගිය සිසුන් තරගය සඳහා සහභාගී කරගත නොහැක.

IV. තරගය සඳහා නම් කරන සිසුන් 06 දෙනාගෙන් බැහැර ව කිසිදු සිසුවෙක් තරගාවලිය සඳහා සහභාගී කළ නොහැක.

V. අදාළ කණ්ඩායම් දෙකෙහි නායකයන්ට තමාගේ ආරම්භක කතාව සඳහා මිනිත්තු 06ක කාලයක් ද, පිළිතුරු කතාව සඳහා මිනිත්තු 04ක කාලයක් ද ලැබේ.

VI. කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ට තම කතාව සඳහා මිනිත්තු 05ක කාලයක් හිමිවේ.

VII. අවසන් තරගය සඳහා පමණක් කණ්ඩායම් දෙකෙහි නායකයන්ගේ ආරම්භක කතාව සඳහා මිනිත්තු 06ක කාලයක් ද, පිළිතුරු කතාව සඳහා මිනිත්තු 05ක කාලයක් ද ලැබේ. කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ට තම කතාව සඳහා මිනිත්තු 05ක කාලයක් හිමිවේ.

VIII. කරුණු ඉදිරිපත් කර අවසන් වීමට නියමිත කාලයට මිනිත්තුවකට පෙර සීනුව එක්වරක් නාද කරනු ලැබේ. කාලය අනවශ්‍ය ලෙස දීර්ඝ කර නොගැනීමට අදාළ තරගකරුවන්ට මෙය උපකාරී වනු ඇත.

IX. කරුණු ඉදිරිපත් කිරීමේ දී හා බිඳ හෙළීමේ දී අධ්‍යයනාංශවල කීර්ති නාමයන්ට කැළැල් වන පරිදි හෝ තරගකරුවන්ගේ හෝ වෙනත් යම් කෙනෙකුගේ කීර්ති නාමයන්ට

කැළැල් වන අයුරින් වාග් ප්‍රහාර එල්ල කිරීම සපුරා තහනම් වන අතර උදාහරණ භාවිතයේ දී ද ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළ යුතුය.

X. තමාගේ කතාව අතරතුර අරුත්සුන්, හාස්‍යජනක, හිස් වදන් හා නෙයෙකුත් ප්‍රදේශීය ව්‍යවහාර භාවිතය හැකිතාක් අවම විය යුතුය.

XI. මෙම විවාද තරගාවලිය පිළිමළුන් පිටුදැකීමේ ක්‍රමයට පැවැත්වෙන අතර අවශ්‍ය අවස්ථාවල දක්ෂතම පරාජිතයන් තරගාවලියට ඇතුළත් කර ගැනීමට විනිශ්චය මණ්ඩලයට තීරණය කළ හැක.

XII. සෑම විවාදයක් අවසානයේ දී ම ඒ පිළිබඳ ව කෙටි අදහසක් විනිශ්චය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

XIII. මෙම විවාද තරගාවලිය සඳහා එක් එක් තරගකරුවාට කථිකත්වය, අංගචලන, වාග් විලාසය, හඬ පාලනය, කරුණු බිඳීම හා කරුණු ඉදිරිපත් කිරීම යන තේමා මත පදනම් ව ලකුණු ලබාදේ. මුළු ලකුණු 100කි.

XIV. මෙහි දී 'දක්ෂතම විවාදකයා' තේරීම ද සිදු කරනු ලැබේ.

XV. තරගාවලියේ සාමාජිකත්වය එම අධ්‍යයනාංශයේ අධ්‍යාපනය ලබන සාමාන්‍ය උපාධි අපේක්ෂකයන්ට ද ලබාගත හැකිය.

XVI. විවාද තරගාවලිය සඳහා තේරී පත්වන තරගකරුවන් අනිවාර්යයෙන් ම ඊළග තරගවට සඳහා සහභාගී විය යුතුවේ.

XVII. අන්තර් අධ්‍යයනාංශ විවාද තරගාවලියෙන් අනතුරු ව පැවැත්වෙන අන්තර් පීඨ විවාද තරගාවලිය සඳහා සුදුසුකම් ලබන්නන් විනිශ්චය මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ.

XVIII. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. කිසිදු හේතුවක් මත විනිශ්චය මණ්ඩලයේ ස්වාභිමතය අභියෝගයට ලක්නොවනු ඇත.


**වැඩිදුර විස්තර සඳහා**

සමායෝජක
අමාලි යසින්තා මුණසිංහ
0773712331/011-2803196

**ලේකම්**
**ආචාර්ය කේ. එම්. ඇලෙක්සැන්ඩර්**